සියලු ම හිමිකම් ඇවිරිණි.

# ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය

## අදියර II විභාගය - 2020 ජූලි

## (201) උසස් මූල්‍ය ගිණුම්කරණය සහ පිරිවැයකරණය

(Advanced Financial Accounting & Costing)

2020-10-03
පෙරවරු
[8.45 – 12.00]

පිටු ගණන : 10
ප්‍රශ්න ගණන: 07

- **අයදුම්කරුවන්ට උපදෙස්** (අවධානයෙන් කියවිය යුතුය):

(1) ***දී ඇති කාලය :*** *කියවීම සඳහා - විනාඩි 15 යි.*
*උත්තර ලිවීම සඳහා - පැය 03 යි.*

(2) ***සියලුම ප්‍රශ්නවලට උත්තර සැපයිය යුතු වේ.***

(3) *ඉල්ලුම් කරන ලද **මාධ්‍යයෙන්, එක් භාෂාවකින් පමණක්,** ඔබ වෙත සපයන ලද **පොත්වල උත්තර** ලියන්න.*

(4) *ගණනය කිරීම් සහ පෙරවැඩ අමුණන්න. උපකල්පන කිසිවක් ඇතොත්, ඒවා පැහැදිලිව දක්වන්න.*

(5) *වැඩසටහන් ගතකිරීම කළ නොහැකි ගණක යන්ත්‍ර **පමණක්** භාවිත කිරීමට ඉඩ දෙනු ලැබේ.*

(6) *අර්ථකථන සහිත **කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව** අමුණා ඇත. වාස්තවික පරීක්ෂණ ප්‍රශ්න හැර අන් සෑම ප්‍රශ්නයක්ම කළ යුතු ක්‍රියාවකින් යුක්ත වේ. කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුවේ එම ක්‍රියාව සඳහා දී ඇති අර්ථකථනය පදනම් කරගෙන අයදුම්කරුවන් විසින් ප්‍රශ්නය සඳහා අවශ්‍ය උත්තර සැපයිය යුතුය.*

(7) *ලකුණු 100 යි.*

---

## A කොටස

### වාස්තවික පරීක්ෂණ ප්‍රශ්න (OTQs)

(මුළු ලකුණු 25)

## 01 වන ප්‍රශ්නය

*අංක 1.1 සිට 1.3 දක්වා ඇති ප්‍රශ්න සඳහා වඩාත්ම නිවැරදි උත්තරය තෝරන්න. තෝරාගත් උත්තරයට අදාල අංකය ප්‍රශ්න අංකය සමග ඔබේ උත්තර පොතේ ලියන්න.*

1.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 02 - තොග ප්‍රමිතය සම්බන්ධයෙන් වන නිවැරදි ප්‍රකාශය තෝරන්න:

(1) කාර්යාලයේ ප්‍රයෝජනය සඳහා පවතින පරිගණක, තොග වශයෙන් සලකනු ලැබේ.

(2) තොග, පිරිවැයට පමණක් අගය කරනු ලැබේ.

(3) තොග පිරිවැය තුළ අන්තර්ගත වනුයේ තොග මිලදී ගැනීමේ පිරිවැය පමණි.

(4) පිරිවැය හෝ ශුද්ධ උපලබ්ධි අගය යන දෙකෙන් වඩා අඩු අගය මත තොග අගය කරනු ලැබේ.

(ලකුණු 02)

1.2 **සීමාසහිත ABC (පෞද්ගලික) සමාගම,** බදු කුලී පදනම මත ගොඩනැගිලි දෙකක් අත්පත්කරගෙන ඇත. 2020 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය තුළදී බදුකුලී වශයෙන් රු.4,812,000/- ක මුදලක් සමාගම විසින් ගෙවා ඇත.

**සීමාසහිත ABC (පෞද්ගලික) සමාගමේ** පොත්වල පහත සඳහන් ශේෂයන් පෙන්නුම් කරනු ලැබේ:

*(රු.)*

| ගිණුමේ නම | 2019 අප්‍රේල් 01 දිනට | 2020 මාර්තු 31 දිනට |
|---|---|---|
| ඉදිරියට ගෙවූ බදු කුලී | 287,000 | 312,000 |
| හිඟ බදු කුලී | 212,000 | 184,000 |

2020 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආදායම් ප්‍රකාශනය තුළ පෙන්විය යුතු නිවැරදි බදු කුලී වියදම වනුයේ:

(1) රු.4,609,000/-. (2) රු.4,759,000/-. (3) රු.4,865,000/-. (4) රු.5,015,000/-.

(ලකුණු 02)

1.3 සමාගමක් විසින් 2016 ඔක්තෝම්බර් 01 දින රු.5,000,000/- ක මුදලකට අත්පත් කරගන්නා ලද මෝටර් රථයක් 2020 මාර්තු 31 දින රු.3,000,000/- ක මුදලකට විකුණන ලදී. සමාගම සරල මාර්ග ක්‍රමයට පිරිවැය මත වාර්ෂිකව 25% බැගින් මෝටර් රථ ක්ෂය කරනු ලබන්නේ නම්, මෙම මෝටර් රථය ඉවත්කිරීමේ ලාභය වනුයේ:

(1) රු.2,375,000/-. (2) රු.3,000,000/-. (3) රු.750,000/-. (4) රු.1,750,000/-.

(ලකුණු 02)

*අංක **1.4** සිට **1.10** දක්වා ඇති ප්‍රශ්නවලට උත්තර, ප්‍රශ්න අංක ද සමඟ ඔබේ උත්තර පොතේ ලියන්න.*

1.4 පිරිවැය ගිණුම්කරණයෙහි අරමුණු දෙකක්(02) සඳහන් කරන්න. (ලකුණු 02)

1.5 "වගකීම" යන පදය නිර්වචනය කරන්න. (ලකුණු 02)

1.6 පහත සඳහන් ඒවාට අදාලව, 1890 හවුල් ව්‍යාපාර ආඥා පනතෙහි ප්‍රතිපාදනය සඳහන් කරන්න:

(a) හවුල් ව්‍යාපාරයේ ප්‍රාග්ධනය.

(b) හවුල්කරුවන්ගේ වැටුප්. (ලකුණු 02)

1.7 **A** සහ **B** යනු, ලාභ සහ අලාභ පිළිවෙලින් 2 : 1 අනුපාතය යටතේ බෙදාගනු ලබන හවුල් ව්‍යාපාරයක හවුල්කරුවන් දෙදෙනෙකි. 2019 අප්‍රේල් 01 දින **C** නව හවුල්කරුවෙකු ලෙස ව්‍යාපාරයට සම්බන්ධ වූ අතර, ලාභ සහ අලාභ පිළිවෙලින් 5 : 3 : 2 අනුපාතය යටතේ බෙදාගැනීමට තීරණය කරන ලදී.

**A** සහ **B** ගේ කැපකළ අනුපාතය ගණනය කරන්න. (ලකුණු 03)

1.8 වාර්තාකරනු ලබන කාලපරිච්ඡේදයෙන් පසුව නමුත් මූල්‍ය ප්‍රකාශන සඳහා අනුමැතිය ලබාදීමට පෙර කාලපරිච්ඡේදය තුළ සිදුවූ පහත සඳහන් එක් එක් සිදුවීම, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත - 10 අනුව, ගැලපිය යුතු සිද්ධියක් ද නැතහොත් නොගැලපිය යුතු සිද්ධියක් ද යන්න සඳහන් කරන්න:

(a) සාමාන්‍ය කොටස්හිමියන් සඳහා ලාභාංශ ප්‍රකාශයට පත්කිරීම.

(b) වාර්තාකරන කාලපරිච්ඡේදයේ අවසන් දිනට පැවති සමහරක් තොග ඒවායේ පිරිවැයට වඩා අඩු අගයකට විකිණීම.

(c) වාර්තාකරන අවසන් දිනට පැවති සමාගමේ ණයගැතියෙකු බුන්වත්භාවයට පත්වීම. (ලකුණු 03)

1.9 සමාගමක ගිණුම් පොත්වලින් **X නිෂ්පාදිතයට** අදාලව පහත සඳහන් තොරතුරු උපුටාගෙන ඇත:

| | |
|---|---|
| වාර්ෂික ඉල්ලුම | : ඒකක 12,500 |
| ඒකකයක වාර්ෂික රඳවාගැනීමේ පිරිවැය | : රු.2/- |
| ඇණවුමක, ඇණවුම් පිරිවැය | : රු.20/- |
| ඒකකයක ගැනුම් මිල | : රු.125/- |

ඔබට පහත සඳහන් සූත්‍රය භාවිත කළ හැකිය,
ආර්ථික ඇණවුම් ප්‍රමාණය:
$$\sqrt{\frac{2DC_0}{C_h}}$$

ඉහත සඳහන් තොරතුරුවලට අනුව, ආර්ථික ඇණවුම් ප්‍රමාණය [Economic Order Quantity (EOQ)] ගණනය කරන්න. (ලකුණු 03)

1.10 **සීමාසහිත රෝස් සමාගමේ, කාර්යය අංක 2500** ට අදාලව පහත සඳහන් තොරතුරු උපුටාගෙන ඇත:

| | |
|---|---|
| සෘජු අමුද්‍රව්‍ය | : කිලෝග්‍රෑම් එකක් රු.25/- බැගින් කිලෝග්‍රෑම් 5,000 |
| සෘජු ශ්‍රමය | : පැයකට රු.500/- බැගින් පැය 200 |
| නිෂ්පාදන පොදුකාර්ය | : සෘජු ශ්‍රම පිරිවැයෙන් 150% |

සමාගම, පිරිවැය මත 20% ක ලාභයක් තබා ගනී.

**කාර්යය අංක 2500** මත අයකළ යුතු මිල ගණනය කරන්න. (ලකුණු 04)

(මුළු ලකුණු 25)

*A කොටසෙහි අවසානය*

## B කොටස

(මුළු ලකුණු 50)

## 02 වන ප්‍රශ්නය

(a) **සීමාසහිත ඩෙකෝ (පෞද්ගලික) සමාගමේ, D001 නිෂ්පාදිතය** සඳහා 2020 ජනවාරි මාසය සඳහා පහත සඳහන් තොරතුරු අදාල වේ:

| දිනය | විස්තරය | ප්‍රමාණය (ඒකක) | ඒකකයක මිල (රු.) |
|---|---|---|---|
| 2020.01.01 | ආරම්භක ශේෂය | 5,000 | 75.00 |
| 2020.01.06 | ගැනුම් | 7,500 | 74.00 |
| 2020.01.10 | නිකුත් කිරීම් | 5,600 | - |
| 2020.01.18 | ගැනුම් | 5,000 | 72.00 |
| 2020.01.25 | නිකුත් කිරීම් | 4,000 | - |

සමාගම, භාරිත සාමාන්‍ය මිල ක්‍රමය [Weighted Average Cost (WAC)] භාවිත කර තොග ලෙජරය පිළියෙල කරනු ලබයි.

**ඔබ විසින් කළ යුතු දෑ:**

2020 ජනවාරි මාසය සඳහා **D001 නිෂ්පාදිතයට** අදාල තොග ලෙජරය **පිළියෙල කරන්න**. (ලකුණු 05)

(b) **සීමාසහිත බ්ලැක් මාර්ක් (පෞද්ගලික) සමාගමේ** 2020 පෙබරවාරි මාසය සඳහා සේවකයන් හතර දෙනෙකුට අදාලව පහත සඳහන් තොරතුරු සපයා ඇත:

| **නම** | **සාමාන්‍ය වැඩකරන පැයකට වේතන අනුපාතය** | **මාසය තුල වැඩකරන ලද පැය** |
|---|---|---|
| S.M. කාවින්ද | පැයකට රු.100/- බැගින් | 180 |
| L.V. ගයේෂා | පැයකට රු.110/- බැගින් | 170 |
| T.B. යමුනා | පැයකට රු.115/- බැගින් | 160 |
| S.P. රොෂාන් | අදාල නොවේ (ස්ථාවර මූලික වැටුප රු.35,000/-) | අදාල නොවේ |

පහත සඳහන් අතිරේක තොරතුරු ද සපයා ඇත:

(1) සාමාන්‍ය වැඩකරන මාසයක් (මූලික වැටුප) වැඩකරන පැය 160 කින් සමන්විත වේ. අතිකාල ගණනය කරනු ලබන්නේ සාමාන්‍ය පැයක වැටුප් අනුපාතයෙන් 140% ක් බැගිනි.

(2) සේවක අර්ථසාධක අරමුදල [Employees' Provident Fund (EPF)] සඳහා සේව්‍ය දායකය හා සේවක දායකය පිළිවෙලින් මූලික වැටුප මත 12% ක් සහ 8% ක් වේ. සේවක භාර අරමුදල [Employee's Trust Fund (ETF)] සඳහා දායකය මූලික වැටුප මත 3% ක් වේ.

(3) මූලික මාසික වැටුපට අමතරව, සියලුම සේවකයන්, මාසිකව රු.3,000/- ක ජීවන වියදම් දීමනාවකට හිමිකම් කියනු ලබයි.

(4) **S.M. කාවින්ද** සහ **T.B. යමුනා** රක්ෂණ යෝජනා ක්‍රමයකට සම්බන්ධ වී ඇති අතර, ඒ සඳහා රු.500/- ක් වන එක් අයෙකුගේ මාසික දායකය, ඔවුන්ගේ වැටුපෙන් අඩුකරගත යුතුය.

**ඔබ විසින් කළ යුතු දැ:**

අවශ්‍ය තොරතුරු පෙන්වමින් 2020 පෙබරවාරි මාසය සඳහා වැටුප් ලේඛනය (payroll) **පිළියෙල කරන්න.**

(ලකුණු 05)
(මුළු ලකුණු 10)

## **03** වන ප්‍රශ්නය

**සීමාසහිත බී සේෆ් (පෞද්ගලික) සමාගම,** තනි නිෂ්පාදිතයක් ලෙස මුහුණු ආවරණ නිෂ්පාදනය කරනු ලබන අතර, එම මුහුණු ආවරණ කැලි 100 ක් අන්තර්ගත පැකට්ටු වශයෙන් විකුණනු ලබයි. එහි කැපුම් සහ මැහුම් යනුවෙන් නිෂ්පාදන දෙපාර්තමේන්තු දෙකක් ද, තාක්ෂණික සේවා යනුවෙන් එක් සේවා දෙපාර්තමේන්තුවක් ද වේ. 2020 දෙසැම්බර් මාසයට අදාලව පහත සඳහන් අයවැයගත තොරතුරු සමාගමේ පොත්වලින් උපුටාගෙන ඇත:

| **පදනම** | **එකතුව** | **දෙපාර්තමේන්තු** | | |
|---|---|---|---|---|
| | | **නිෂ්පාදන** | | **තාක්ෂණික සේවා** |
| | | **කැපුම්** | **මැහුම්** | |
| වක්‍ර පිරිවැය (රු.) | 150,000 | 45,000 | 60,000 | 45,000 |
| බිම් ප්‍රමාණය (වර්ග මීටර්) | 4,800 | 1,600 | 2,800 | 400 |
| සේවක සංඛ්‍යාව | 250 | 90 | 120 | 40 |
| විදුලිය භාවිතය (කිලෝවොට්) | 2,200 | 600 | 1,400 | 200 |
| යන්ත්‍ර වටිනාකම (රු.'000) | 500 | 100 | 400 | - |
| පිරිවැය විභජනය - තාක්ෂණික සේවා | 100% | 45% | 55% | - |
| සෘජු ශ්‍රම පැය ගණන | 7,000 | 2,000 | 5,000 | - |

මාසයට අදාල අනෙකුත් අයවැයගත පොදුකාර්ය පිරිවැය පහත පරිදි වේ:

| | **රු.** |
|---|---|
| යන්ත්‍ර නඩත්තු | 100,000 |
| ගොඩනැගිලි කුලී | 360,000 |
| විදුලිය | 66,000 |
| සේවක සුභසාධනය | 400,000 |

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) එක් එක් නිෂ්පාදන දෙපාර්තමේන්තුව සඳහා පොදුකාර්ය පිරිවැය වෙන්කර විභජනය කරනු ලබන්නේ කෙසේදැයි පෙන්වීම සඳහා ප්‍රකාශනයක් **පිළියෙල කරන්න**. (ලකුණු 07)

(b) එක් එක් නිෂ්පාදන දෙපාර්තමේන්තුව සඳහා සෘජු ශ්‍රම පැයකට පොදුකාර්ය පිරිවැය අන්තර්ග්‍රහණ අනුපාතය **ගණනය කරන්න**. (ලකුණු 03)

(මුළු ලකුණු 10)

## 04 වන ප්‍රශ්නය

**ගැමුණු ක්‍රිකට් සමාජය,** එහි සාමාජිකයන්ට ක්‍රීඩා පහසුකම් සපයනු ලබන ක්‍රීඩා සමාජයක් වන අතර, සාමාජිකයන්ගේ අවශ්‍යතාවය සඳහා ආපනශාලාවක් පවත්වාගෙන යයි. 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා **ගැමුණු ක්‍රිකට් සමාජයේ** ලැබීම් සහ ගෙවීම් ගිණුම පහත පරිදි වේ:

**ලැබීම් සහ ගෙවීම් ගිණුම** *(රු.'000)*

| | | | |
|---|---|---|---|
| 2019 ජනවාරි 01 - ශේෂය ඉ/ගෙ | 10,200 | ලේඛණ කටයුතු වියදම් | 1,500 |
| පරිත්‍යාග | 1,050 | දුරකතන වියදම් | 675 |
| සාමාජික මුදල් | 13,350 | විදුලිය වියදම් | 2,100 |
| ආපනශාලා විකුණුම් | 40,000 | පුහුණු කිරීමේ වියදම් | 3,150 |
| | | ආපනශාලා සැපයුම් සඳහා ගෙවීම් | 25,000 |
| | | වැටුප් සහ වේතන | 12,720 |
| | | ශේෂය ප/ගෙ | 19,455 |
| | **64,600** | | **64,600** |

වත්කම් සහ වගකීම් පහත සඳහන් පරිදි වේ: *(රු.'000)*

| | 2019 ජනවාරි 01 දිනට | 2019 දෙසැම්බර් 31 දිනට |
|---|---|---|
| ගොඩනැගිලිවල ධාරණ අගය | 80,000 | 78,000 |
| ක්‍රීඩා උපකරණවල ධාරණ අගය | 20,000 | 17,500 |
| ආපනශාලා සැපයුම් සඳහා ගෙවිය යුතු මුදල් | 8,000 | 12,000 |
| තොග (ආපනශාලා) | 5,000 | 7,000 |
| හිඟ සාමාජික මුදල් | 900 | 600 |
| ඉදිරියට ගෙවූ සාමාජික මුදල් | 300 | 450 |
| උපචිත විදුලිය | 300 | 600 |

පහත සඳහන් අතිරේක තොරතුරු ද සපයා ඇත:

(1) පරිත්‍යාග, වර්ෂයේ ආදායමක් ලෙස හඳුනාගත යුතුය.

(2) වර්ෂය තුළ දේපළ, පිරියත සහ උපකරණ අත්පත් කරගැනීම් හෝ ඉවත් කිරීම් කිසිවක් නොතිබුණි.

(3) විදුලි වියදම්වලින් $1/3$ ක් සහ වැටුප් සහ වේතනවලින් $1/2$ ක් ආපනශාලාවට අදාල වේ.

**ඔබ විසින් කළ යුතු දෑ:**

**ගැමුණු ක්‍රිකට් සමාජයට** අදාලව, 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පහත සඳහන් දෑ **පිළියෙල කරන්න:**

(a) ආපනශාලා වෙළෙඳ ගිණුම. (ලකුණු 03)

(b) ආදායම් සහ වියදම් ගිණුම. (ලකුණු 07)

(මුළු ලකුණු 10)

## **05** වන ප්‍රශ්නය

**රංජිත්, සුනිල්** සහ **තිලක්** යනු ලාභ'ලාභ පිළිවෙලින් 5:3:2 අනුපාතය යටතේ බෙදාගනු ලබන හවුල්ව්‍යාපාරයක හවුල්කරුවන්ය. එක් අයෙකුට රු.20,000/- බැගින් වූ මාසික වැටුපකට **රංජිත්** සහ **සුනිල්** හිමිකම් කියති.

පහත සඳහන් අතිරේක තොරතුරු ද සපයා ඇත:

(1) 2020 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා හවුල් ව්‍යාපාරයේ ශුද්ධ ලාභය රු.1,600,000/- කි.

(2) 2020 මාර්තු 31 දිනට හවුල් ව්‍යාපාරයේ පොත්වල පහත සඳහන් ශේෂයන් පැවතුණි:

| | හර (රු.) | බැර (රු.) |
|---|---:|---:|
| 2019 අප්‍රේල් 01 දිනට ප්‍රාග්ධන ගිණුම්: | | |
| **රංජිත්** | | 2,250,000 |
| **සුනිල්** | | 1,350,000 |
| **තිලක්** | | 900,000 |
| 2019 අප්‍රේල් 01 දිනට ජංගම ගිණුම්: | | |
| **රංජිත්** | | 95,000 |
| **සුනිල්** | 500,000 | |
| **තිලක්** | 200,000 | |
| ගැනිලි: | | |
| **රංජිත්** | 780,000 | |
| **සුනිල්** | 260,000 | |
| **තිලක්** | 60,000 | |

(3) **තිලක්,** 2020 මාර්තු 31 දිනට හවුල් ව්‍යාපාරයෙන් විශ්‍රාම ගැනීමට තීරණය කරන ලද අතර, **තිලක්** විශ්‍රාම ගැනීමෙන් අනතුරුව **රංජිත්** සහ **සුනිල්** විසින් ලාභ'ලාභ පිළිවෙලින් 5:3 අනුපාතය යටතේ බෙදාගනිමින් හවුල් ව්‍යාපාරය පවත්වාගෙන යෑමට තීරණය කරන ලදී.

(4) 2020 මාර්තු 31 දින, හවුල් ව්‍යාපාරයේ කීර්තිනාමය රු.1,200,000/- කට අගය කරන ලදී. කෙසේවෙතත්, හවුල් ව්‍යාපාරයේ පොත්වල කීර්තිනාම ගිණුමක් පවත්වා නොගැනීමට තීරණය කරන ලදී.

(5) විශ්‍රාම ගැනීම නිසා තිලක්ට ගෙවිය යුතු මුදල ණය ගිණුමකට මාරු කිරීමට තීරණය විය.

**ඔබ විසින් කළ යුතු දෑ:**

2020 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පහත සඳහන් දෑ **පිළියෙල කරන්න**:

(a) ලාභ'ලාභ විසර්ජන ගිණුම. (ලකුණු 03)

(b) හවුල්කරුවන්ගේ ප්‍රාග්ධන ගිණුම. (ලකුණු 04)

(c) හවුල්කරුවන්ගේ ජංගම ගිණුම. (ලකුණු 03)

(මුළු ලකුණු 10)

## 06 වන ප්‍රශ්නය

**ඇනී,** සමාගමක ලේකම්වරියක් ලෙස කටයුතු කරනු ලබයි. රටෙහි පැවති COVID-19 වාතාවරණය තුළ ඇයට යම් කාලයක් නිවසටම වී කාලය ගත කිරීමට සිදුවිය. එම කාලය අතරතුරදී, ඇය විසින් රු.100,000/- ක මුදලක් ආයෝජනය කර, කේක් පුඩිස්සා පාරිභෝගිකයන්ට බෙදාහැරීම සඳහා ***" ඔන්ලයින් ෆුඩ්ස් බයි ඇනී "*** නමින් ව්‍යාපාරයක් 2020 අප්‍රේල් 01 දින ආරම්භ කරන ලදී. **ඇනී** විසින් සියලුම ගෙවීම් චෙක්පත් මගින් සිදුකරනු ලබන අතර, සියලුම මුදල් ලැබීම් සහ ගෙවීම්, මුදල් පොතෙහි වාර්තා කරනු ලබයි. 2020 ජූනි 30 දිනෙන් අවසන් මාස තුන සඳහා **ඇනීගේ** මුදල් පොත පහත සඳහන් පරිදි වේ:

**ඔන්ලයින් ෆුඩ්ස් බයි ඇනී**

**මුදල් පොත**

| දිනය | විස්තරය | චෙක්පත් අංකය | ලැබීම් (රු.) | ගෙවීම් (රු.) |
|---|---|---|---|---|
| 2020.04.01 | තැන්පතු - **ඇනීගේ** ප්‍රාග්ධන ආයෝජනය | | 100,000 | - |
| 2020.04.01 | බදු කුලී (මාස 3 ක කාර්යාල බදු කුලිය) | 637131 | | 31,500 |
| 2020.04.01 | සෘජු අමුද්‍රව්‍ය සඳහා ගෙවීම් (පිටි, සීනි සහ බටර්) | 637132 | | 36,000 |
| 2020.04.01 | අනෙකුත් සෘජු අමුද්‍රව්‍ය සඳහා ගෙවීම් | 637133 | | 5,600 |
| 2020.04.01 | උපකරණ මිලදී ගැනීම් | 637134 | | 50,000 |
| 2020.04.15 | මුදල් තැන්පතු - විකුණුම් | | 13,000 | |
| 2020.04.30 | මුදල් තැන්පතු - විකුණුම් | | 14,000 | |
| 2020.04.30 | බැංකු ගාස්තු | | | 1,500 |
| 2020.04.30 | ප්‍රචාරණය | 637135 | | 3,500 |
| 2020.04.30 | මාසික බෙදාහැරීමේ ගාස්තු | 637136 | | 7,500 |
| 2020.04.30 | අනෙකුත් සෘජු අමුද්‍රව්‍ය සඳහා ගෙවීම් | 637137 | | 4,500 |
| 2020.05.15 | මුදල් තැන්පතු - විකුණුම් | | 7,000 | |
| 2020.05.31 | මුදල් තැන්පතු - විකුණුම් | | 14,000 | |
| 2020.05.31 | අනෙකුත් සෘජු අමුද්‍රව්‍ය සඳහා ගෙවීම් | 637138 | | 12,600 |
| 2020.05.31 | මාසික බෙදාහැරීමේ ගාස්තු | 637139 | | 7,500 |
| 2020.06.15 | මුදල් තැන්පතු - විකුණුම් | | 17,950 | |
| 2020.06.24 | සෘජු අමුද්‍රව්‍ය සඳහා ගෙවීම් (පිටි සහ සීනි) | 637140 | | 13,750 |
| 2020.06.29 | මුදල් තැන්පතු - විකුණුම් | | 20,500 | |
| 2020.06.29 | මාසික බෙදාහැරීමේ වියදම් | 637141 | | 7,500 |
| 2020.06.30 | ශේෂය ප/ගෙ | | | 5,000 |
| | | | **186,450** | **186,450** |
| 2020.07.01 | ශේෂය ඉ/ගෙ | | 5,000 | |

පහත සඳහන් අතිරේක තොරතුරු ද ඔබට සපයා ඇත:

(1) 2020 ජූනි 30 දිනට අමුද්‍රව්‍ය තොගයේ පිරිවැය රු.6,750/- ක් වූ අතර, නිමි භාණ්ඩ තොග කිසිවක් නොවිය.

(2) 2020 ජූලි 01 දින, 2020 අප්‍රේල් සිට 2020 ජූනි දක්වා කාලය සඳහා වන රු.1,350/- ක ජල බිලපත් ද, රු.7,200/- ක විදුලි බිල්පත් ද ලැබුණු අතර, මේ සඳහා ගෙවීම් 2020 ජූලි මාසය තුළදී සිදුකරන ලදී.

(3) මෙම මාස 3 තුළදී විකුණුම්වලට අදාලව ලැබුණු මුදල්වලින් රු.6,200/- ක මුදලක් බැංකු ගත නොකර **ඇනී** විසින් තම පෞද්ගලික ප්‍රයෝජනය සඳහා ලබා ගන්නා ලදී.

(4) 2020 ජූනි 30 දින, විකුණුම්වලට අදාලව රු.7,800/- ක මුදලක් එකතුකර ගන්නා ලද නමුත් ඒවා බැංකුගත කරන ලද්දේ 2020 ජූලි 01 දිනය.

(5) උපකරණවල ප්‍රයෝජනවත් ආයු කාලය වර්ෂ 2 ක් වන අතර, ඒවා පිරිවැය මත සරල මාර්ග ක්‍රමයට ක්ෂය කරනු ලබයි.

(6) සියලුම ගැනුම් සහ විකුණුම් මුදල් පදනම මත සිදුකරන ලදී.

**ඔබ විසින් කළ යුතු දෑ:**

2020 ජූනි 30 දිනට ***" ඔන්ලයින් ෆුඩ්ස් බයි ඇනී "*** හි ශේෂ පිරික්සුම **පිළියෙල කරන්න**. (ලකුණු 10)

*B කොටසෙහි අවසානය*

# C කොටස

(මුළු ලකුණු 25)

## 07 වන ප්‍රශ්නය

**සීමාසහිත බියුටි මාට් (පෞද්ගලික) සමාගමේ,** 2020 මාර්තු 31 දිනට ශේෂ පිරික්සුම පහත පරිදි වේ:

*(රු.'000)*

| | හර | බැර |
|---|---|---|
| 2019 අප්‍රේල් 01 දිනට ප්‍රකාශිත ප්‍රාග්ධනය (සාමාන්‍ය කොටස් 2,000,000) | | 16,000 |
| 2019 අප්‍රේල් 01 දිනට, රඳවාගත් ඉපැයීම් | | 11,710 |
| පිරියත සහ උපකරණ - පිරිවැයට: | | |
| යන්ත්‍ර සූත්‍ර | 20,000 | |
| මෝටර් වාහන | 8,800 | |
| 2019 අප්‍රේල් 01 දිනට සමුච්චිත ක්ෂයවීම්: | | |
| යන්ත්‍ර සූත්‍ර | | 8,000 |
| මෝටර් වාහන | | 2,200 |
| 2020 මාර්තු 31 දිනට, තොගය | 6,200 | |
| වෙළෙඳ ලැබිය යුතු මුදල් | 9,650 | |
| අතැති මුදල් සහ බැංකුවේ මුදල් | 9,720 | |
| වෙළෙඳ ගෙවිය යුතු මුදල් | | 1,500 |
| 2019 අප්‍රේල් 01 දිනට, වෙළෙඳ ලැබිය යුතු මුදල් සඳහා ප්‍රතිපාදනය | | 430 |
| ගෙවිය යුතු ආදායම් බදු | | 150 |
| විකුණුම් | | 27,000 |
| විකුණුම් පිරිවැය | 10,700 | |
| කාර්යාල කුලී | 900 | |
| විදුලිය | 940 | |
| ජලය හා දුරකතන | 425 | |
| ප්‍රචාරණය | 800 | |
| වැටුප් සහ වේතන | 2,200 | |
| විකුණුම් කණ්ඩායම සඳහා දිරි දීමනා | 500 | |
| බැංකු ගාස්තු | 50 | |
| ගෙවූ ණයකර පොලී | 300 | |
| රක්ෂණය | 240 | |
| මුද්‍රණ හා ලිපිද්‍රව්‍ය | 365 | |
| 12% ණයකර | | 5,000 |
| වර්ෂය සඳහා ආදායම් බදු වියදම | 200 | |
| | **71,990** | **71,990** |

පහත සඳහන් අතිරේක තොරතුරු ද සපයා ඇත:

(1) 2020 මාර්තු 31 දින ගණනය කර අගය කරන ලද අවසාන තොගය එදිනට ගිණුම් පොත්වලට ගෙන ඇත. කෙසේවෙතත් පසුව, එනම් 2020 අප්‍රේල් 05 දින අනාවරණය වූයේ එම අවසාන තොගය තුළ පැවති රු.40,000/- ක පිරිවැයක් සහිත තොගයක් කල් ඉකුත්වී ඇති බවයි. මේ සම්බන්ධයෙන් කිසිදු ගැලපීමක් ගිණුම් පොත්වල සිදුකර නොමැත.

(2) පිරියත සහ උපකරණ, සරල මාර්ග ක්‍රමය අනුව පිරිවැයට ක්ෂය කරනු ලබයි. පිරියත සහ උපකරණවල ප්‍රයෝජනවත් ආයු කාලය පහත සඳහන් පරිදි ඇස්තමේන්තුගත කර ඇත:

| | | |
|---|---|---|
| යන්ත්‍ර සූත්‍ර | : | වර්ෂ 5 |
| මෝටර් වාහන | : | වර්ෂ 4 |

(3) 2020 මාර්තු 31 දිනට, උපචිත විදුලි වියදම් රු.80,000/- ක් ගිණුම්ගත කළ යුතුව ඇත.

(4) COVID-19 වසංගත තත්ත්වය නිසා ආපසු අයකරගත නොහැකි රු.270,000/- ක අගයකින් යුතු වෙළෙඳ ලැබිය යුතු මුදල් ලියාහැරීමට තීරණය කරන ලදි. තවද, 2020 මාර්තු 31 දිනට පැවති ඉතිරි වෙළෙඳ ලැබිය යුතු මුදල් ශේෂයෙන් 5% ක ප්‍රතිපාදනයක් සිදුකළ යුතු වේ.

(5) 2019/20 තක්සේරු වර්ෂයට අදාළව ආදායම් බදු වියදම වශයෙන් ගිණුම් පොත්වල රු.200,000/- ක් වාර්තා කර ඇත. කෙසේවෙතත්, පසුව සිදුකරන ලද නැවත තක්සේරු කිරීමකදී අනාවරණය වූයේ 2019/20 තක්සේරු වර්ෂයට අදාල ආදායම් බදු වියදම රු.275,000/- ක් විය යුතු බවයි.

(6) 2019 අප්‍රේල් 01 දින, සමාගම එකක් රු.100/- බැගින් 12% ණයකර 50,000 ක් නිකුත් කරන ලදී. ණයකර මත පොලිය වර්ෂයකට දෙවතාවක් ගෙවිය යුතු වේ.

(7) කොටසක් රු.10/- බැගින් ප්‍රසාද කොටස් නිකුතුවක් සිදුකිරීම මඟින්, රඳවාගත් ඉපැයීම්වලින් රු.8,000,000/- ක් ප්‍රාග්ධනීත කළ යුතු බව, 2020 මාර්තු 01 දින පැවති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී තීරණය කරන ලදී. මේ සම්බන්ධයෙන් වන සියලුම නෛතික ක්‍රියාමාර්ග 2020 මාර්තු 31 දින වනවිට අවසන් කර තිබූ නමුත් ඒ සම්බන්ධයෙන් ගිණුම් පොත්වල කිසිදු සටහනක් තබා නොතිබුණි.

(8) සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මූල්‍ය ප්‍රකාශන නිකුත් කිරීම සඳහා වන අනුමැතිය 2020 මැයි 22 දින ලබාදෙන ලදී.

**ඔබ විසින් කළ යුතු දෑ:**

කළමනාකාරිත්වයේ භාවිතය සඳහා **සීමාසහිත බියුටි මාට් (පෞද්ගලික) සමාගමේ,** පහත සඳහන් දෑ **පිළියෙල කරන්න**:

(a) 2020 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ලාභ'ලාභ සහ වෙනත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය (විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය). (ලකුණු 14)

(b) 2020 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය. (ලකුණු 11)

(මුළු ලකුණු 25)

*C කොටසෙහි අවසානය*

## කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව

| නිපුණතා මට්ටම | විස්තරය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචනය |
|---|---|---|---|
| **දැනුම (1)** | තොරතුරු සහ මූලික සංකල්ප ආවර්ජනය කිරීම | **අදින්න** | හැඩයක් හෝ රූපසටහනක් ගෙන හැර දැක්වීම. |
| | | **සම්බන්ධ කරන්න** | තාර්කික හෝ හේතු කාරක සම්බන්ධතාව තහවුරු කිරීම. |
| | | **සඳහන් කරන්න** | ස්ථිර ලෙස හෝ පැහැදිලිව ප්‍රකාශ කිරීම. |
| | | **හඳුනා දක්වන්න** | සැලකිලිමත්වීමෙන් පසුව හඳුනා ගැනීම, තහවුරු කිරීම හෝ තෝරා ගැනීම. |
| | | **ලැයිස්තුගත කරන්න** | විස්තර කිරීමකින් තොරව සම්බන්ධිත අයිතම ලිවීම. |

| නිපුණතා මට්ටම | විස්තරය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචනය |
|---|---|---|---|
| **අවබෝධය (2)** | අදහස් හා තොරතුරු පැහැදිලි කිරීම. | **හඳුනාගන්න** | අන්දැකීම් හෝ දැනුම භාවිතයෙන් වලංගුබව හෝ වෙනත් ආකාරයෙන් පෙන්වීම. |
| | | **අර්ථකතනය කරන්න** | වටහාගත හැකි හෝ හුරුපුරුදු පදවලට පරිවර්තනය කරන්න. |
| | | **විස්තර කරන්න** | ප්‍රධාන ලක්ෂණ ලියා සන්නිවේදනය කරන්න. |
| | | **පැහැදිලි කරන්න** | අදාල කරුණු භාවිත කර පැහැදිලි විස්තරයක් කිරීම. |
| | | **නිර්වචනය කරන්න** | ස්වභාවය, විෂය පථය හෝ තේරුම නිශ්චිතව ප්‍රකාශ කිරීම. |

| නිපුණතා මට්ටම | විස්තරය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචනය |
|---|---|---|---|
| **භාවිතය (3)** | අළුත් තත්ත්වයන් තුළ දැනුම භාවිත කර ගැලපීම. | **සසඳන්න** | තවත් එකක් සමග අනුගත / අනුරූප කරන්න. |
| | | **ප්‍රස්තාර දක්වන්න** | ප්‍රස්තාර මගින් නියෝජනය කරන්න. |
| | | **තක්සේරු කරන්න** | වටිනාකම, ස්වභාවය, හැකියාව හෝ ගුණාත්මක බව තීරණය කරන්න. |
| | | **විසඳන්න** | ගණනය කිරීම හා / හෝ පැහැදිලි කිරීම් හරහා විසඳුම් සෙවීම. |
| | | **පිළියෙල කරන්න** | විශේෂ අරමුණ සඳහා යමක් කිරීම හෝ සූදානම් වීම. |
| | | **ප්‍රදර්ශනය කරන්න** | උදාහරණ සමග ඔප්පු කිරීම හෝ ප්‍රදර්ශනය කිරීම. |
| | | **ගණනය කරන්න** | ගණිතමය ගණනය කිරීම මගින් සොයා දැනගැනීම හෝ ගණන් ගැනීම. |
| | | **භාවිත කරන්න** | ප්‍රයෝගිකව භාවිතයේ යෙදෙන්න. |

| නිපුණතා මට්ටම | විස්තරය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචනය |
|---|---|---|---|
| **විශ්ලේෂණය (4)** | අදහස් අතර සම්බන්ධතා ගොඩනගා ප්‍රශ්න විසදීම. | **සන්නිවේදනය කරන්න** | තොරතුරු බෙදාහදා ගැනීම හෝ හුවමාරු කර ගැනීම. |
| | | **සැකිල්ලක් සේ දක්වන්න** | සුවිශේෂී ලක්ෂණ සාරාංශ කොට දැක්වීම. |
| | | **අසමානතා බලන්න** | අසමානතා හෝ වෙනස්කම් සෙවීම පිණිස පරීක්ෂා කිරීම. |
| | | **සමානකම් බලන්න** | සමානකම් සොයාගැනීම පිණිස පරීක්ෂා කිරීම. |
| | | **විමසන්න** | තර්ක මගින් සවිස්තර ලෙස පරීක්ෂා කිරීම. |
| | | **වෙනස්කොට දක්වන්න** | යමක් තවෙකෙකින් වෙනස්කොට දක්වන දැ හඳුනා ගැනීම. |
| | | **විශ්ලේෂණය කරන්න** | විසඳුම් හෝ ප්‍රතිඵලය තීරණය කිරීම පිණිස විස්තරාත්මකව පරීක්ෂා කරන්න. |